# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

## ශිෂ්‍යොම්කරණය - 33

### නිපුණතාව 07

නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි

අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : චිරන්තා සූරියආරච්චි මිය

ර/ බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය

වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල |
|---|---|---|
| 7.1 නිෂ්පාදන ව්‍යාපාරයක නිෂ්පාදන පිරිවැය ගණනය කරයි. | • නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ අවශ්‍යතාව<br>• නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංග<br>• ප්‍රාථමික පිරිවැය<br>• ඍජු ද්‍රව්‍ය පිරිවැය<br>• ඍජු ශ්‍රම පිරිවැය<br>• ඍජු වෙනත් පිරිවැය<br>• නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය<br>• නිෂ්පාදන ව්‍යාපාරයක ඇති තොග<br>• අමුද්‍රව්‍ය තොගය<br>• නොනිමි තොගය<br>• නිමි තොගය | • නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ අවශ්‍යතාව දක්වයි.<br>• නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංග පැහැදිලි කරයි.<br>• නිෂ්පාදන ව්‍යාපාරයක ඇති තොග වර්ග පැහැදිලි කරයි.<br>• නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී නොනිමි තොගය නිෂ්පාදන පිරිවැයට ගණනය කරයි.<br>• නිෂ්පාදන පිරිවැය ගණනය කරයි.<br>• නිෂ්පාදන පිරිවැය ඇසුරින් විකුණුම් පිරිවැය ගණනය කරයි. |
| 7.2 නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන ඇසුරෙන් තීරණ ගනියි | • නිෂ්පාදන පිරිවැය ගණනය කර, ගිනුම්ගත කර වාර්තා කිරීම.<br>• නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන<br>• නිෂ්පාදන පිරිවැය ලේඛනය<br>• ආදායම් ප්‍රකාශනය<br>• මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | • නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.<br>• නිෂ්පාදන පිරිවැය ලේඛනයක් ඇසුරෙන් නිෂ්පාදන පිරිවැය මූලිකාංග මතු කර දක්වයි |

# නිෂ්පාදන පිරිවැය ලේඛන

භාණ්ඩ පිටතින් මිලදීගෙන විකුණන ව්‍යාපාරයක් විසින් යම් නිශ්චිත ගිණුම් කාලපරිච්ඡේදයක් සඳහා උපයන ලද ලාභය හෝ අලාභය ගණනය කිරීම සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කරනු ලැබේ. භාන්ඩ තමන් විසින්ම නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාර ද බහුලව දක්නට ලැබේ. මෙම ව්‍යාපාර නිෂ්පාදන ව්‍යාපාර වන අතර නිෂ්පාදන ව්‍යාපාර විසින් ද කිසියම් නිශ්චිත ගිණුම් කාලපරිච්ඡේදයක් සඳහා උපයන ලද ලාභය හෝ අලාභය සෙවිය යුතු වේ. මෙම ව්‍යාපාරවල විකුණුම් පිරිවැය වන්නේ; නිෂ්පාදනය සඳහා දැරූ පිරිවැය හා එම භාණ්ඩ විකුණුම් තත්ත්වයට පත්කිරීම සඳහා දරන මුළු වියදම්වල එකතුවයි. ඒ අනුව නිෂ්පාදන ව්‍යාපාරවල උපයන ලද ලාභය හෝ අලාභය සෙවීම සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනයක් පිළියෙල කර නිෂ්පාදන පිරිවැය ගණනය කළ යුතු වේ.

## නිෂ්පාදන පිරිවැය ලේඛනය

නිෂ්පාදන ව්‍යාපාර විසින් කිසියම් ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ නිපදවන ලද භාණ්ඩ වෙනුවෙන් දරන ලද පිරිවැය ගණනය කිරීම සඳහා  නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළියෙල කරනු ලබයි.

## නිෂ්පාදන පිරිවැය ලේඛනයක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව

1. මුළු නිෂ්පාදන පිරිවැය සෙවීම
2. නිෂ්පාදන පිරිවැය පාලනය කිරීම
3. නිෂ්පාදන වියදම විධිමත් ආකාරයට වර්ගීකරණය කිරීම
4. ඒකකයක නිෂ්පාදන පිරිවැය සෙවීම
5. නිෂ්පාදන පිළිබඳ තීරණ ගැනීම
6. ඒකකයක විකුණුම් මිල තීරණය කිරීමට නිෂ්පාදන පිරිවැය ඉවහල්කර ගැනීම

## නිෂ්පාදන පිරිවැය

භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීම සඳහා දරන ලද මුළු පිරිවැය නිෂ්පාදන පිරිවැය වේ. නිෂ්පාදන පිරිවැය වර්ග කිරීමේදී එය ප්‍රධාන කොටස් දෙකකි.

1. ප්‍රාථමික පිරිවැය (ඍජු පිරිවැය)
2. නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (වක්‍ර පිරිවැය)

## ඍජු පිරිවැය

නිෂ්පාදන ඒකකයක් සමග පැහැදිලිව වෙන්කර හඳුනාගත හැකි පිරිවැය ඍජු පිරිවැය වේ. මෙම ඍජු පිරිවැය ප්‍රධාන අංග තුනකි.

1. ඍජු ද්‍රවය පිරිවැය
2. ඍජු ශ්‍රම පිරිවැය
3. ඍජු වෙනත් වියදම්

## ඍජු ද්‍රව්‍ය පිරිවැය

නිෂ්පාදනයට ඍජුව අදාළ නිෂ්පාදන ඒකක සමග පැහැදිලිව වෙන්කර හඳුනාගත හැකි ද්‍රව්‍ය වලට වැය වූ පිරිවැයයි.

උදා:- පාන් නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා පිටි.
ලී බඩු නිපදවන ආයතනයක දැව.
ඇඳුම් මැසීමේ ආයතනයක රෙදි.

## ඍජු ශ්‍රම පිරිවැය

නිෂ්පාදිත සැකසීමට ඍජුව දායක වන ශ්‍රමිකයන් වෙනුවෙන් දරන පිරිවැය ඍජු ශ්‍රම පිරිවැයයි.

උදා:- ඇඳුම් මැසීමේ ආයතනතක ; රෙදි කැපීමේ, රෙදි මැසීමේ යෙදෙන අයට ගෙවන වැටුප් හා සියලුම දීමනා
ලී බඩු නිෂ්පාදන ආයතනයක වඩු කාර්මික වැටුප

## ඍජු වෙනත් වියදම්.

නිෂ්පාදිත ඒකකයක් සමග පැහැදිලිව වෙන්කර හඳුනාගත හැකි ද්‍රව්‍ය හා ශ්‍රමය නොවන වෙනත් වියදම් ඍජු වෙනත් වියදම් වේ.

උදා:- මෝස්තර නිර්මාණය කිරීමේ වියදම්
නිෂ්පාදන ඒකක අනුව ගෙවන පුරස්කාර

## වක්‍ර පිරිවැය

නිෂ්පාදන ඒකකය සමග ඍජුව හඳුනාගත නොහැකි පිරිවැය වක්‍ර පිරිවැය වේ. නමුත් නිෂ්පාදන ක්‍රියාවළියට වක්‍රව හෝ දායක වීම නිසා වක්‍ර පිරිවැය ද නිෂ්පාදන පිරිවැයේ කොටසක් වේ. මෙම පිරිවැය ද ප්‍රධාන අංග තුනකි.

1. වක්‍ර ද්‍රවය පිරිවැය
2. වක්‍ර ශ්‍රම පිරිවැය
3. වක්‍ර වෙනත් වියදම්

## වක්‍ර ද්‍රව්‍ය පිරිවැය

නිෂ්පාදන ක්‍රියාවළියට දායක වන එහෙත් ඍජු ද්‍රව්‍ය පිරිවැය මෙන් ම නිෂ්පාදන ඒකකය තුළට අන්තර්ගත ප්‍රමාණය නිශ්චිතව මැනිය නොහැකි ද්‍රව්‍ය සඳහා දරන පිරිවැය වක්‍ර ද්‍රව්‍ය පිරිවැය වේ. මෙය සෑම භාණ්ඩ ඒකකයක් සඳහාම සමාන ප්‍රමාණයකින් දරන්නේ යැයි කිව නොහැක.

උදා:- බේකරියක දර,චීස්, බටර්,කලරින්
ඇඳුම් මසන ආයතනයක නූල්, බොත්තම්
ලී බඩු නිෂ්පාදන ආයතනයක පොලිෂ්, තීන්ත, ඇණ

## වක්‍ර ශ්‍රම පිරිවැය

නිෂ්පාදන ක්‍රියාවළියේදී නිෂ්පාදන ඒකකයක් සමග ඍජුවම දායක නොවන එහෙත් නිෂ්පාදන කටයුතු වලට වක්‍රව සම්බන්ධ වන ශ්‍රමය සඳහා දරන පිරිවැය වක්‍ර ශ්‍රම පිරිවැය වේ.
උදා:- කම්හල් සුපරීක්ෂක වේතන
කම්හල් මුරකරු වැටුප
කම්හල් ලිපිකරු වැටුප්

## වක්‍ර වෙනත් වියදම්

නිෂ්පාදන ක්‍රියාවළියට දායක වන වක්‍ර ද්‍රව්‍ය හා වක්‍ර ශ්‍රමය සඳහා දරන පිරිවැයට අමතරව දරන අනෙකුත් වියදම් වක්‍ර වෙනත් වියදම් වේ.
උදා:- කර්මාන්තශාලා කුලී, යන්ත්‍ර ක්ෂය, කම්හල් විදුලිය, කම්හල් රක්ෂණ

ඉහත පිරිවැය වර්ග පහත පරිදි දැක්විය හැක.

නිෂ්පාදන පිරිවැය = ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය

ප්‍රාථමික පිරිවැය = සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් වියදම්

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය = වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රම පිරිවැය + වක්‍ර වෙනත් වියදම්

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය = නිෂ්පාදන පිරිවැය - ප්‍රාථමික පිරිවැය

ප්‍රාථමික පිරිවැය = නිෂ්පාදන පිරිවැය - නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය

1. බේකරි නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් පහත සඳහන් වියදම් සෘජු ද වක්‍ර ද යන්න දක්වන්න.
   - පිටි ............
   - බටර් ............
   - පාන් පුළුස්සන්නාගේ වැටුප් ............
   - දර ............
   - විදුලිය හා රක්ෂණ ............
2. ඇඟලුම් නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් පහත සඳහන් වියදම් සෘජු ද වක්‍ර ද යන්න දක්වන්න.
   - රෙදි .............
   - නූල් .............
   - බොත්තම් .............
   - ඇඳුම් මසන්නියන්ගේ වැටුප් .............
   - කම්හල් ගොඩනැගිලි ක්ෂය .............
   - යන්ත්‍ර ක්ෂය ............
   - සුපරීක්ෂක වේතන .............
   - මෝස්තර නිර්මාණ වියදම් .............

## නිෂ්පාදන ව්‍යාපාරයක දැකිය හැකි තොග

**අමුද්‍රව්‍ය තොග**

හාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා හා පාවිච්චි කිරීමට ඇති ද්‍රව්‍ය

උදා:- ලී බඩු ආයතනයක ඇති දැව
පාවහන් නිෂ්පාදන ආයතනයක ඇති සම්

**නොනිමි තොග**

නිෂ්පාදනය වෙමින් පවතින ද්‍රව්‍ය

උදා:- ඉදිවෙමින් පවතින ගොඩනැගිලි
එකලස් නොකල මේස

**නිමි තොගය**

උදා:- සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සඳහා විකිණීමේ තත්ත්වයට පත්කර ඇති තොග

උදා:- ලී බඩු ආයතනයක නිම කළ මේස
පාවහන් ආයතනයක නිම කළ පාවහන්

**පාරිභෝජිත අමුද්‍රව්‍ය පිරිවැය ගණනය කිරීම.**

| | | |
|---|---|---|
| ආරම්භක අමුද්‍රව්‍ය තොගය | | xx |
| + අමුද්‍රව්‍ය ගැණුම් | xxx | |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ කුලී | xx | |
| අමුද්‍රව්‍ය පැටවීමේ හා බෑමේ කුලී x | | |
| | Xxxx | |

| | | |
|---|---|---|
| - අමුද්‍රව්‍ය ආපසු යැවුම් | (xx) | xxxx |
| | | xxxx |
| - අවසාන අමුද්‍රව්‍ය තොගය | | (xx) |
| පාරිභෝජිත අමුද්‍රව්‍ය පිරිවැය | | xxx |

3. ලී බඩු නිෂ්පාදන ආයතනයක 2020.03.31 න් අවසන් වර්ෂය සඳහා අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2019.04.01 දැව තොගය | රු. | 50 000 |
| දැව ගැනුම් | රු. | 375 000 |
| දැව ගෙන ඒමේ කුලී | රු. | 5 000 |
| බලපත්‍ර ගාස්තු | රු. | 7 500 |
| දැව ආපසු යැවුම් | රු. | 12 000 |
| දැව හානි | රු. | 2 500 |
| 2020.03.31 දැව තොගය | රු. | 15 500 |

2020.03.31 න් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ පාරිභෝජිත අමුද්‍රව්‍ය පිරිවැය ගණනය කරන්න.

## ප්‍රාථමික පිරිවැය ගණනය කිරීම

ඉහත ගණනය කරන ලද පාරිභෝජිත අමුද්‍රව්‍ය පිරිවැයට සෘජු වැටුප් හා සෘජු වෙනත් වියදම් එකතු කිරීමෙන් **ප්‍රාථමික පිරිවැය ගණනය කරනු ලැබේ.**

| | | |
|---|---|---|
| පාරිභෝජිත අමුද්‍රව්‍ය පිරිවැය | xxx | |
| සෘජු වැටුප් | | xx |
| සෘජු වෙනත් වියදම් | xx | |
| **ප්‍රාථමික පිරිවැය** | | **xxx** |

## නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම

නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ නිමි භාණ්ඩ වෙනුවෙන් හෝ නොනිමි භාන්ඩ වෙනුවෙන් දරා ඇති සියලුම සෘජු වියදම්වල හා වක්‍ර වියදම්වල එකතුව මුළු නිෂ්පාදන පිරිවැය වේ.

| | | |
|---|---|---|
| පාරිභෝජිත අමුද්‍රව්‍ය පිරිවැය | xxx | |
| ප්‍රාථමික පිරිවැය | xx | |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | xx | |
| | | xxx |
| + ආරම්භක නොනිමි | x | |
| | | xxx |
| - අවසන් නොනිම් | | ( x) |
| නිෂ්පාදන පිරිවැය | | xxx |

4. ABC නිෂ්පාදන ව්‍යාපාරයේ 2020.03.31 න් අවසන් වර්ෂය සඳහා අදාළ තොරතුරු පහත දැක්වේ.

2019.04.01 දිනට තොග

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 23 000 |
| නොනිමි | 17 500 |

| | |
|---|---|
| සෘජු වැටුප් | 78 000 |
| අමුද්‍රව්‍ය ගැණුම් | 97 500 |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ කුලී | 5 000 |
| කම්හල් රක්ෂණ | 12 000 |
| කම්හල් විදුලිය | 14 000 |
| යන්ත්‍ර ක්ෂය | 7 500 |
| සුපරීක්ෂක වේතන | 15 500 |
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | 2 500 |
| සෘජු වෙනත් වියදම් | 10 000 |
| ඉන්ධන | 18 000 |
| 2020.03.31 දිනට තොග | |
| අමුද්‍රව්‍ය | 20 000 |
| නොනිමි | 8 000 |

මෙම ව්‍යාපාරයේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළියෙල කරන්න.

5. ජයසිරි නිෂ්පාදන ව්‍යාපාරයේ 2020.03.31 දිනට පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| 2019.04.01 දිනට තොග | |
| අමුද්‍රව්‍ය | 60 000 |
| ඉන්ධන | 40 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 30 000 |
| ගැණුම් - අමුද්‍රව්‍ය | 350 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 75 000 |
| ඉන්ධන | 80 000 |
| සෘජු නිෂ්පාදන වැටුප් | 160 000 |
| නිෂ්පාදන මත පුරස්කාර | 40 000 |
| ලී බඩු උපකරණ පිරිවැය | 600 000 |
| යන්ත්‍ර පිරිවැය | 800 000 |
| විදුලිය | 15 000 |
| වරිපනම් හා කුලී | 12 000 |
| රක්ෂණය | 15 000 |
| කර්මාන්තශාලා කුලිය | 80 000 |
| වක්‍ර වේතන | 5 000 |
| පරිභෝජන ද්‍රව්‍ය | 40 000 |
| යන්ත්‍ර අලුත්වැඩියා වියදම් | 20 000 |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ කුලිය | 6 000 |
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | 5 000 |

අතිරේක තොරතුරු

1. 2020.03.31 දිනට තොග

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 40 000 |
| ඉන්ධන | 20 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 25 000 |

2. ජංගම නොවන වත්කම් වාර්ෂිකව 10% බැගින් පිරිවැය මත ක්ෂය කරනු ලැබේ.
3. විදුලිය හා වරිපනම් රු. 2 000 බැගින් ගෙවිය යුතුය ඇත.
4. රක්ෂණ රු. 3 000 ක් ඉදිරියට ගෙවා ඇත.

2020.03.31දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළියෙල කරන්න.

6. පහත දැක්වෙන්නේ ඉසුරු ප්‍රඩක්ෂන් ආයතනයේ 2020.03.31 දිනය අදාළ තොරතුරු කිහිපයකි.

| | |
|---|---|
| 2019.04.01 දිනට තොග | |
| අමුද්‍රව්‍ය | 30 000 |
| ඉන්ධන | 10 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 15 000 |
| නොනිමි භාණ්ඩ | 8 000 |
| ගැණුම් | |
| අමුද්‍රව්‍ය | 15 000 |
| ඉන්ධන | 30 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 20 000 |
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | 2 000 |
| වැටුප් හා වේතන | 75 000 |
| විදුලිය | 20 000 |
| වරිපනම් හා බදු | 12 000 |
| රක්ෂණය | 8 000 |
| අමුද්‍රව්‍ය ගැණුම් වියදම් | 5 000 |
| පුරස්කාර | 15 000 |
| යන්ත්‍ර | 250 000 |
| ගොඩනැගිලි | 350 000 |

අතිරේක තොරතුරු

1. 2020.03.31 තොග

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 15 000 |
| ඉන්ධන | 10 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 20 000 |
| නොනිමි | 12 000 |

2. ජංගම නොවන වත්කම් වාර්ෂිකව 10% බැගින් පිරිවැය මත ක්ෂය කරනු ලැබේ.
3. වැටුප් හා වේතන වලින් රු. 15 000 ක් වක්‍ර වැටුප්ය.
4. විදුලිය රු. 5 000 ක් උපචිත ඇති අතර රු. 1 000 ක් ඉදිරි ගිණුම් වර්ෂය සඳහාය.
   2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළියෙල කරන්න.

7. සී/ස සුගතදාස නිෂ්පාදන ව්‍යාපාරයේ 2020.03.31 දින පොත් වලින් උපුටාගත් ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| 2019.04.01 තොග | |
| අමුද්‍රව්‍ය | 40 000 |
| නිමි භාණ්ඩ | 60 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 20 000 |
| නොනිමි භාණ්ඩ | 50 000 |
| ගැණුම් | |
| අමුද්‍රව්‍ය | 380 000 |
| නිමි භාණ්ඩ | 40 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 75 000 |

| | |
|---|---|
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | 5 000 |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ වියදම් | 10 000 |
| නිමි භාණ්ඩ ගෙනඒමේ වියදම් | 12 000 |
| කම්හල් සෘජු වේතන | 300 000 |
| කම්හල් වක්‍ර වේතන | 50 000 |
| යන්ත්‍ර උපකරණ පිරිවැය | 800 000 |
| කම්හල් නඩත්තු වියදම් | 15 000 |
| යන්ත්‍ර නඩත්තු වියදම් | 45 000 |
| යන්ත්‍ර අලුත්වැඩියා වියදම් | 15 000 |
| කම්හලේ විදුලිය | 25 000 |
| කම්හල් වරිපනම් | 12 000 |
| පරිභෝජන ද්‍රව්‍ය | 10 000 |
| විකුණුම් | 1 400 000 |
| ආපසු එවුම් | 20 000 |

අතිරේක තොරතුරු

1. 2020.03.31 දිනට තොග
   - අමුද්‍රව්‍ය 30 000
   - නොනිමි 40 000
   - ඇසුරුම් ද්‍රව්‍ය 25 000
2. යන්ත්‍ර වාර්ෂිකව 10% බැගින් පිරිවැය මත ක්ෂය කරනු ලැබේ.
3. යන්ත්‍ර නඩත්තු වියදම් වලින් රු. 20 000 ක් ලබන වර්ෂයට අදාල වේ.

   2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය හා වෙළෙඳ ගිණුම .

8. ශාන්තගේ ව්‍යාපාරයේ 2020.03.31 දිනට පොත් වලින් උපුටාගත් ශේෂ පහත දැක්වේ.

| | රු. 000 |
|---|---|
| 2019.04.01 තොග | |
| අමුද්‍රව්‍ය | 100 |
| නිමි භාණ්ඩ | 400 |
| නොනිමි භාණ්ඩ | 380 |
| අමුද්‍රව්‍ය ගැණුම් | 1 400 |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ වියදම් | 240 |
| සෘජු වැටුප් | 2 200 |
| සෘජු වෙනත් වියදම් | 460 |
| වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | 450 |
| වක්‍ර වැටුප් | 475 |
| වරිපනම් - කම්හල | 100 |
| කාර්යාල | 25 |
| විදුලිය - කම්හල | 45 |
| කාර්යාලය | 35 |
| විකුණුම් | 13 000 |
| කාර්යාල වැටුප් | 650 |

අතිරේක තොරතුරු

1. 2020.03.31 දිනට තොග

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 120 000 |
| නොනිමි | 200 000 |
| නිමි | 600 000 |

2. ජංගම නොවන වත්කම් ක්ෂය

| | |
|---|---|
| කර්මාන්තශාලාව | 20 000 |
| කාර්යාලය - යන්ත්‍ර | 36 000 |
| කාර්යාල උපකරණ | 24 000 |

අවශ්‍ය වන්නේ;

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය හා වෙළෙඳ ගිණුම .

9. සීමිත ජනතා සමාගමේ 2020.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය ගැණුම් | 75 000 | |
| 2019.04.01 දිනට ජංගම නොවන වත්කම් පිරිවැය හා සමුච්ඡිත ක්ෂය | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 100 000 | 10 000 |
| යන්ත්‍ර | 200 000 | 30 000 |
| 2019.04.01 දිනට තොග | | |
| අමුද්‍රව්‍ය | 10 000 | |
| නොනිමි | 8 000 | |
| නිමි | 12 000 | |
| ලිපිද්‍රව්‍ය | 10 000 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 80 000 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 64 000 |
| විදුලිය | 10 000 | |
| ඍජු වැටුප් | 4 000 | |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 10 000 | |
| රක්ෂණ | 8 000 | |
| 2019.04.01 දිනට හානිකරණ අලාභ මත වෙන් කිරීම් | | 7 000 |
| විකුණුම් | | 300 000 |
| 15% ආයෝජන | 100 000 | |
| ආයෝජන ආදායම් | | 18 000 |
| බැංකු | 2 000 | |
| ප්‍රාග්ධනය | | 213 000 |
| ඉන්ධන | 8 000 | |
| ලිපිද්‍රව්‍ය | 5 000 | |
| | 642 000 | 642 000 |

අතිරේක තොරතුරු

1. 2020.03.31 දිනට තොග

   අමුද්‍රව්‍ය 11 000, නොනිමි 4 000, නිමි 6 000 , ඉන්ධන 2 000

2. ගොඩනැගිලි හා යන්ත්‍ර වාර්ෂිකව පිරිවැය මත 5% බැගින් ක්ෂය කරයි. ඉඩමේ අගය රු. 30 000 යි.

3. විදුලි ගාස්තු රු. 5 000 ක් ගෙවිය යුතුය.
4. රක්ෂණ ගාස්තු වලින් ½ ක් ද විදුලි ගාස්තු වලින් 3/5 ක් ද කම්හල සඳහාය.
5. බොල් ණය ලෙස රු. 3 000 ක් කපා හැර අඩමාන ණය ලෙස ඉතිරි ණයගැතියන්ගෙන් 10%ක් වන සේ ගලපන්න.
6. ආයෝජනය මිලදීගෙන ඇත්තේ 2017.04.01 දිනය.

අවශ්‍ය වන්නේ;

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය හා ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

## ඇගයීම

ඉමේෂා ඇපරල්ස් ආයතනයේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයයි.

| විස්තරය | හර (රු.000) | බැර (රු.000) |
|---|---|---|
| 2019.04.01 තොග | | |
| අමුද්‍රව්‍ය | 900 | |
| නොනිමි | 325 | |
| නිමි | 1 500 | |
| අමුද්‍රව්‍ය ගැණුම් | 7 430 | |
| නිමි භාණ්ඩ මිලට ගැණුම් | 1 855 | |
| විකුණුම් | | 29 870 |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ කුලී | 238 | |
| යන්ත්‍ර ක්‍රියාකාරී වැටුප් | 2 970 | |
| යන්ත්‍ර ක්‍රියාකාරී ප්‍රසාද දීමනා | 900 | |
| කම්හල් කළමනාකරණ වේතන | 200 | |
| මෝස්තර නිර්මාණ වියදම් | 1 800 | |
| කර්මාන්තශාලා කුලී | 620 | |
| යන්ත්‍ර අලුත්වැඩියා වියදම් | 290 | |
| ලිපිද්‍රව්‍ය | 110 | |
| ප්‍රාග්ධනය | | 10 000 |
| බොල් ණය | 10 | |
| 2019.04.01 දිනට හානිකරණ | | |
| අලාභ සඳහා වෙන් කිරීම් | | 17 |
| 2019.04.01 දිනට ජංගම නොවන | | |
| වත්කම් සහ සමුච්ඡිත ක්ෂය | | |
| ඉඩම් ගොඩනැගිලි | 9 500 | 1 500 |
| යන්ත්‍ර | 8 000 | 1 000 |
| කාර්යාල උපකරණ | 3 000 | 200 |
| වට්ටම් | 4 | 6 |
| 20% බැංකු ණය | | 250 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 205 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 140 |
| බැංකු ගාස්තු | 15 | |
| පරිත්‍යාග | 100 | |
| ඉන්ධන හා බලය | 1 800 | |
| කර්මාන්තශාලා මුරකරු වේතන | 130 | |
| ණය පොලී | 40 | |
| බැංකු | 1 041 | |
| | 42 983 | 42 983 |

අතිරේක තොරතුරු

1. 2020.03.31 දිනට තොග තත්ත්වයන් පහත පරිදිය.
   - අමුද්‍රව්‍ය රු. 850 000
   - නොනිමි රු. 275 000
   - නිමි රු. 800 000
2. ගොඩනැගිලි, යන්ත්‍ර හා කාර්යාල උපකරණ පිළිවෙලින් වාර්ෂිකව 10% ,20% හා 5% බැගින් ක්ෂය කළ යුතුය.
3. ව්‍යාපාරයේ කර්මාන්තශාලාව නිෂ්පාදන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බැවින් 2019.12.31 දින සිට මාසිකව රු. 80 000 ක් කුලී ගිවිසුමක් යටතේ ගොඩනැගිල්ලක් ලබා ගන්නා ලදි.
4. ඉන්ධන හා බලය සම්පූර්ණයෙන්ම කර්මාන්තශාලාවට අදාළවන අතර ප්‍රවර්ථන වර්ෂයේ මාර්තු මාසය සඳහා ඉන්ධන සඳහා තවත් රු. 120 000 ක් ගෙවිය යුතුය.
5. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2018.07.01 දිනය.
6. වෙළෙඳ ලැබිය යුතු දෑ වලින් රු. 5 000 ක් බොල්ණය ලෙස කපාහැර ඉතිරි අයගෙන් 10%ක් හානිකරණ අලාභ සඳහා වෙන් කළ යුතුය.
7. ගොඩනැගිලි ක්ෂය වලින් ¼ ක් වෙළෙඳ අංශය සඳහා වේ.

මෙම තොරතුරු උපයෝගී කරගනිමින් ඉමේෂා ඇපරල්ස් ආයතනයේ

1. 2020.03.31 න් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය හා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

**මාසික පරීක්ෂණය**

1. ඇඟළුම් කර්මාන්තශාලාවකට අදාළව දරණ ලද පිරිවැය පහත දක්වා ඇත. ඒවා සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම, සෘජු වෙනත් හා නිෂ්පාදන පොදුකාර්ය ලෙස දක්වන්න.

   I. ඇඟළුම් සඳහා භාවිතා කරන ලද රෙදිවල ගැණුම් මිල
   II. රෙදි ආනයනය සඳහා දැරූ තීරු ගාස්තු හා ගෙන ඒමේ කුලී
   III. ඇඟළුම් කර්මාන්තශාලා සුපරීක්ෂක වේතන
   IV. කර්මාන්තශාලා ගොඩනැගිලි කුලී
   V. මහන මැෂින් ක්‍රියාකරුවන් සඳහා වැටුප් හා වේතන
   VI. අමුද්‍රව්‍ය ගොඩබෑමේ කුලිය
   VII. ඇඟළුම් මෝස්තර නිර්මාණකරුට ඒකක පදනම මත කරනු ලබන ගෙවීම්
   VIII. කම්හල් යන්ත්‍ර ක්ෂය
   IX. කම්හල් කළමනාකරණ වැටුප්
   X. කම්හල් විදුලිය හා බලශක්ති වියදම්
   XI. කම්හල් පරිභෝජන ද්‍රව්‍ය
   XII. මහන මැෂින් ක්‍රියාකරුවන් සඳහා අතිකාල ගෙවීම්

2. පහත සඳහන් එක් එක් ප්‍රශ්නය සඳහා වඩාත්ම සුදුසු පිළිතුර තෝරන්න.

   I. නිෂ්පාදන ලාභය සටහන් කිරීම සම්බන්ධයෙන් නිවැරදි ද්විත්ව සටහන වනුයේ
      a) වෙනත් විස්තීර්ණ ආදායම් හර කර නිෂ්පාදන ගිණුම බැර කිරීමය.
      b) ලාභාලාභ ගිණුම හර කර නිෂ්පාදන ගිණුම බැර කිරීමය.
      c) නිෂ්පාදන ගිණුම හර කර ලාභාලාභ ගිණුම බැර කිරීමය.

d) නිෂ්පාදන ගිණුම හර කර වෙනත් විස්තීර්ණ ආදායම් බැර කිරීමය.

II. වාහන නිෂ්පාදනය කරනු ලබන ව්‍යාපාර ආයතනයක ජංගම නොවන වත්කමක් නොවන්නේ,පහත සඳහන් ඒවා අතුරින් කුමක් ද?
a) කර්මාන්තශාලා ගොඩනැගිලි
b) නිමි නිෂ්පාදිත
c) යන්ත්‍රෝපකරණ
d) බෙදාහැරීමේ වාහන

III. ප්‍රාථමික පිරිවැය යනු කුමක් ද?
a) වඩා වැදගත් පිරිවැය සියල්ලෙහිම එකතුවය.
b) සියලුම සෘජු පිරිවැය සහ සියලුම නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයවල එකතුව වේ.
c) සියලුම සෘජු ද්‍රව්‍ය පිරිවැය සහ සියලුම සෘජු ශ්‍රම පිරිවැයෙහි එකතුව වේ.
d) සියලුම සෘජු ද්‍රව්‍ය පිරිවැය, සියලුම සෘජු ශ්‍රම පිරිවැය සහ සියලුම සෘජු වෙනත් පිරිවැයෙහි එකතුව වේ.

IV. සම්පූර්ණ පිරිවැයට අගය කරන ලද වර්ෂ අවසාන නොනිමි තොගය වර්ෂය තුළදී වැඩිවී ඇත්නම් , එය බලපානු ලබන්නේ,
a) නිමි තොගයේ පිරිවැය අඩු වීමටය.
b) පොදුකාර්ය වියදම් අඩු වීමටය.
c) ප්‍රාථමික පිරිවැය අඩු වීමටය.
d) ප්‍රාථමික පිරිවැය වැඩි වීමටය.

V. නිමි භාණ්ඩවල මුළු නිෂ්පාදන පිරිවැය සමන්විත වනුයේ ;
a) සියලුම ද්‍රව්‍ය සහ ශ්‍රම පිරිවැයෙනි.
b) නිමි භාණ්ඩ වෙනුවෙන් දැරූ සියලුම පිරිවැයෙනි.
c) සියලුම සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම සහ වෙනත් සෘජු පිරිවැයෙනි.
d) සියලුම සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම සහ වෙනත් නිෂ්පාදන නොවන වියදම් වලිනි.

පහත සඳහන් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය යන වග දක්වන්න.

VI. නිශ්චිත නිෂ්පාදන ක්‍රියාවළියක් සමග අනුබද්ධිත පිරිවැය හඳුන්වනු ලබන්නේ නිෂ්පාදන පිරිවැය යනුවෙනි.
a) සත්‍ය වේ. b) අසත්‍ය වේ.

VII. නිෂ්පාදන ක්‍රියාවළිය වෙනුවෙන් නොදැරූ ; නමුත් එදිනෙදා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් ආයතනයක් විසින් දරන ලද වියදම් නිෂ්පාදන පිරිවැය ලෙස හැඳින්වේ.
a) සත්‍ය වේ. b) අසත්‍ය වේ.

VIII. අමුද්‍රව්‍යයන්, නිමකල භාණ්ඩවල ඉතාමත් වටිනා කොටසක් වන අතර නිෂ්පාදන ක්‍රියාවළිය සඳහා ද්‍රව්‍යයන් අත්පත් කර ගැනීම සඳහා දරන ලද පිරිවැය සෘජු ද්‍රව්‍ය පිරිවැය ලෙස හැඳින්වේ.
a) සත්‍ය වේ. b) අසත්‍ය වේ.

IX. සියලුම සෘජු පිරිවැයන් නිමැවුම් මට්ටමට අනුරූපීව වෙනස්විය යුතුය.
a) සත්‍ය වේ. b) අසත්‍ය වේ.

X. කාලච්ඡේදයේ නිෂ්පාදන පිරිවැය වෙළෙඳ ගිණුමට මාරු කිරීමේ ද්විත්ව සටහන වනුයේ; වෙළෙඳ ගිණුම හර, නිෂ්පාදන ගිණුම බැර

a) සත්‍ය වේ. b) අසත්‍ය වේ.